# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1850/28 - 2014 පෙබරවාරි මස 18 වැනි අඟහරුවාදා - 2014.02.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1992 අංක 59 දරන සත්ව රෝග පනත**

5 වැනි වගන්තියේ කරනු ලබන නියමය හා ඊට ආනුෂංගික විධිවිධාන

1992 අංක 59 දරන සත්ව රෝග පනතේ පළමු වන උපලේඛනයේ සඳහන් සංස්පර්ශයක රෝගයක් වන කුර හා මුඛ රෝග, උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ විවිධ ප්‍රදේශවල, ඇති වී තිබෙන බවට මා වෙත තොරතුරු ලැබී ඇති බැවින්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය) ඩබ්ලිව්. කේ. ද සිල්වා වන මා, එම පනතේ 5(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව,

(1) උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කය එම පනතේ කාර්යය සඳහා කුර හා මුඛ රෝග ආසාදිත ප්‍රදේශ ලෙස ද,

(2) ගවයන්, මී ගවයන්, එළුවන්, බැටළුවන් හා ඌරන් යන සත්ව වර්ගයේ සතුන් රෝග ආසාදිත සතුන් ලෙස ද,

මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

(3) මෙම නියමය, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක වන අතර, කලින් ඉවත් කළ හොත් මිස හෝ, එම පනතේ 5(3) වගන්තිය අනුව වලංගු කාලය දීර්ඝ කළ හොත් මිසක්, ක්‍රියාත්මක වන දින සිට මාස තුනක කාලයක වලංගු විය යුතු අතර එම මාස තුනක කාලය ඉකුත් වීමෙන් අවලංගු වේ.

02. මෙම නියමය වලංගුව පවතින කාලය තුළ, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වන මා -

(1) ඇති වී තිබෙන කුර හා මුඛ රෝගය ආසාදිත ප්‍රදේශයට සීමා කිරීම සඳහා හා පැතිරීමට ඇති ඉඩකඩ වැළැක්වීම සඳහා අවශ්‍ය වන බැවින්, ආසාදිත ප්‍රදේශයේ පහත සඳහන් ක්‍රියා හා කටයුතු මෙයින් තහනම් කරමි.

(i) රෝග අවදානමට ලක් ව සිටින සත්ව විශේෂ සම්බන්ධ කෘතිම අභිජනන ක්‍රමවේද.

(ii) අවදානමට ලක් ව ඇති එවැනි සතුන් ඝාතනය කිරීම.

(iii) එවැනි සතුන් භාවිත කොට ගැන සජීවී සත්ව වෙළඳපල පැවැත්වීම, දර්ශන හා තරඟ පැවැත්වීම.

(iv) අවධානයට ලක් ව ඇති සතුන්, සත්ව නිෂ්පාදන හා රෝග කාරක ද්‍රව්‍ය විකිණීම, විකිණීමට පාත්‍ර කිරීම, ගබඩා කිරීම හෝ බෙදා හැරීම.


1A - PG 1974 — 135 (2014/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(v) සත්ව රෝග පනතේ 5(4) වගන්තිය යටතේ අදාළ ආසාදිත ප්‍රදේශ භාර රජයේ පශු වෛද්‍ය නිලධාරියා විසින් නිකුත් කරන ලද අවසරයකින් තොර ව, අවදානමට ලක් ව සිටින සතුන්, සත්ව නිෂ්පාදන හෝ රෝග කාරක ද්‍රව්‍ය, ආසාදිත ප්‍රදේශයේ සිට ඉවත් කිරීම, රැගෙන යාම, පලවා හැරීම හෝ ප්‍රවාහනය කිරීම.

(vi) කුර හා මුඛ රෝග හේතුවෙන් මරමුවට පත් වූවා හෝ ආපාචනය වූවා යැයි සැකයට හේතු වූ යම් සතෙකුගේ මළකුණක් හෝ එහි කොටසක් හෝ වෙනත් කිසියම් අවදානමට ලක් වූ ද්‍රව්‍යයක් හෝ ජලය සම්බන්ධ කිසිදු ස්ථානයකට දැමීම හෝ

(vii) එවැනි රෝගයකින් මරමුවට පත් වූ හෝ ආපාචනයට ලක් වූවා යැයි සැකයට හේතු වූ යම් සතෙකුගේ මළකුණක් හෝ එහි කොටසක්, වෙන සතුන් විසින් වෙනත් ස්ථානයකට හෝ ප්‍රදේශයට හෝ රැගෙන යා හැකි වන පරිදි, යම් ස්ථානයක දැමීම හෝ ස්ථාන ගත කිරීම.

(2) එම පනතේ 6(1) වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර ව, ආසාදිත ප්‍රදේශය තුළ පිහිටි පාරවල් ඔස්සේ රෝග ආසාදිත සත්ව වර්ගයේ සතුන් ප්‍රවාහනය කිරීම මෙයින් තහනම් කරමි.

(3) එම පනතේ 6(1) හා 6(2) යන වගන්තිවල විධිවිධාන ක්‍රියාත්මක කිරීම කාර්ය සඳහා, උතුරු මැද පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා විසින් එම කුර හා මුඛ රෝග ආසාදිත ප්‍රදේශය තුළ දී තීරණය කරනු ලබන ස්ථානවල බාධක යෙදවිය යුතු බව නියම කරමි.

(4) රෝග ආසාදිත ප්‍රදේශයට ආසන්නව, උතුරු මැද පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ වරයා විසින් තීරණය කරනු ලබන අවරෝධක කලාපයේ සිටින්නා වූ අවධානයට ලක් වූ සෑම සතෙකුටම, එම අවරෝදක කලාප භාර රජයේ පශු වෛද්‍ය නිළධාරියා විසින් නියම කරනු ලබන වේලාවේ දී හා ස්ථානයේ දී, කුර හා මුඛ රෝගයට එරෙහිව ප්‍රතිශක්තිකරණය කරවා ගැනීම එම සතාගේ අයිතිකරු විසින් සිදු කළ යුතු බව, එම සත්ව රෝග පනතේ 7(1) වගන්තියෙන් මා වෙත පැවරී අති බලතල අනුව නියම කරමි.

(5) එම සත්ව රෝග පනතේ 38 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බල තල ප්‍රකාර ව,

(අ) මෙම නියෝගයේ 2(1) වගන්තියෙන් තහනම් කරන ලද ක්‍රියා සිදුවීම් වැළැක්වීම හා, එවෙනි කටයුතු වල නියැලෙන අයට විරුද්ධව නීතිමය කටයුතු කිරීම යනු කාර්ය සඳහා එම පනතේ 3(3) වගන්තිය යටතේ බලයලත් නිලධාරි වශයෙන් කටයුතු කිරීම සඳහා ද, ඒ වෙනුවෙන් එම පනතේ 13 වැනි වගන්තියේ සඳහන් බලතල ක්‍රියාත්මක කිරීමටද, පහත සඳහන් නිලධාරීන්ට බලය පවරමි.

(i) අධ්‍යක්ෂ (සත්ව සෞඛ්‍ය) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.
(ii) නියෝජ්‍ය අධ්‍යක්ෂ (සත්ව සෞඛ්‍ය), සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.
(iii) පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ, උතුරු මැද පළාත.
(iv) අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියළුම කොට්ඨාස භාර රජයේ පශු වෛද්‍ය නිළධාරීන්.
(v) ශ්‍රී ලංකා පොලිස් සේවයේ සියලුම පොලිස් නිළධාරීන්.

(ආ) එම පනතේ 6(3) වගන්තියේ කාර්ය සඳහා, බලයලත් නිලධාරී ලෙස කටයුතු කිරීමට, ශ්‍රී ලංකා පොලිසියේ සියලු ම පොලිස් නිලධාරීන්ට බලය පවරමි.

(ඇ) එම පනතේ 14 වැනි වගන්තියේ කාර්ය සඳහා ද, ඊට අදාළ ව එම පනතේ 13 වගන්තියේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ද, අනුරාධපුර දිස්ත්‍රික්කයේ පශු විමර්ශන නිලධාරී, බලයලත් නිලධාරි බවට පත් කරමි.

(ඈ) රෝග ආසාදිත ප්‍රදේශවලට අදාළ ව, එම පනතේ 3(2), 5(4), 12(1) හා 12(2) යන වගන්තිවල, පශු වෛද්‍ය නිලධාරියෙකුට පැවරී ඇති බලතල හා රාජකාරී, තමන්ගේ බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා, එම ප්‍රදේශ භාර රජයේ පශු වෛද්‍ය නිලධාරීන්ට බලය පවරමි.

(ඉ) එම පනතේ 9 හා 11 වන වගන්තිවල කාර්ය සඳහා ද, ඊට අදාළ ව, 13 වන වගන්තියෙන් බලයලත් නිලධාරියෙකුට පවරා ඇති බලතල හා රාජකාරි ක්‍රියාත්මක කිරීම සඳහා ද, අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියළු රජයේ පශු වෛද්‍ය නිලධාරියන්, බලයලත් නිලධාරි ලෙස කටයුතු කළ යුතු බව මෙයින් නියෝග කරමි.

(වෛද්‍ය) ඩබ්ලිව්. කේ. ද සිල්වා,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

03 - 92/1

## 1992 අංක 59 දරන සත්ව රෝග පනත

### 5 වැනි වගන්තියේ කරනු ලබන නියමය හා ඊට ආනුෂංගික විධිවිධාන

1992 අංක 59 දරන සත්ව රෝග පනතේ පළමු වන උප ලේඛනයේ සඳහන් සංස්වර්ශයක රෝගයක් වන කුර හා මුඛ රෝග, උතුරු පළාතේ වවුනියා දිස්ත්‍රික්කයේ ද, මුලතිව් දිස්ත්‍රික්කයේ ඔඩ්ඩිසුට්ටාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ද විවිධ ප්‍රදේශවල, ඇති වී තිබෙන බවට මා වෙත තොරතුරු ලැබී ඇති බැවින්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය) ඩබ්ලිව්. කේ. ද සිල්වා වන මා, එම පනතේ 5(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව,

(1) උතුරු පළාතේ වවුනියා දිස්ත්‍රික්කයේ ද, මුලතිව් දිස්ත්‍රික්කයේ ඔඩ්ඩිසුට්ටාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ද එම පනතේ කාර්යය සඳහා කුර හා මුඛ රෝග ආසාදිත ප්‍රදේශ ලෙස ද,

(2) ගවයන්, මී ගවයන්, එළුවන්, බැටළුවන් හා ඌරන් යන සත්ව වර්ගයේ සතුන් රෝග ආසාදිත සතුන් ලෙස ද,

මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

(3) මෙම නියමය, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක වන අතර, කලින් ඉවත් කළ හොත් මිස හෝ, එම පනතේ 5(3) වගන්තිය අනුව වලංගු කාලය දීර්ඝ කළ හොත් මිසක්, ක්‍රියාත්මක වන දින සිට මාස තුනක කාලයක වලංගු විය යුතු අතර එම මාස තුනක කාලය ඉකුත් වීමෙන් අවලංගු වේ.

02. මෙම නියමය වලංගුව පවතින කාලය තුළ, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වන මා -

(1) ඇති වී තිබෙන කුර හා මුඛ රෝගය ආසාදිත ප්‍රදේශයට සීමා කිරීම සඳහා හා පැතිරීමට ඇති ඉඩකඩ වැළැක්වීම සඳහා අවශ්‍ය වන බැවින්, ආසාදිත ප්‍රදේශයේ පහත සඳහන් ක්‍රියා හා කටයුතු මෙයින් තහනම් කරමි.

(i) රෝග අවදානමට ලක් ව සිටින සත්ව විශේෂ සම්බන්ධ කෘති ම අභිජනන ක්‍රමවේද.

(ii) අවදානමට ලක් ව ඇති එවැනි සතුන් ඝාතනය කිරීම.

(iii) එවැනි සතුන් භාවිත කොට ගැන සජීවී සත්ව වෙළඳපල පැවැත්වීම, දර්ශන හා තරග පැවැත්වීම.

(iv) අවධානයට ලක් ව ඇති සතුන්, සත්ව නිෂ්පාදන හා රෝග කාරක ද්‍රව්‍ය විකිණීම, විකිණීමට පාත්‍ර කිරීම, ගබඩා කිරීම හෝ බෙදා හැරීම.

(v) සත්ව රෝග පනතේ 5(4) වගන්තිය යටතේ අදාළ ආසාදිත ප්‍රදේශ භාර රජයේ පශු වෛද්‍ය නිලධාරියා විසින් නිකුත් කරන ලද අවසරයකින් තොර ව, අවදානමට ලක් ව සිටින සතුන්, සත්ව නිෂ්පාදන හෝ රෝග කාරක ද්‍රව්‍ය, ආසාදිත ප්‍රදේශයේ සිට ඉවත් කිරීම, රැගෙන යාම, පලවා හැරීම හෝ ප්‍රවාහනය කිරීම.

(vi) කුර හා මුඛ රෝග හේතුවෙන් මරමුවට පත් වූවා හෝ ආපාචනය වූවා යැයි සැකයට හේතු වූ යම් සතෙකුගේ මළකුණක් හෝ එහි කොටසක් හෝ වෙනත් කිසියම් අවදානමට ලක් වූ ද්‍රව්‍යයක් හෝ ජලය සම්බන්ධ කිසිදු ස්ථානයකට දැමීම හෝ

(vii) එවැනි රෝගයකින් මරමුවට පත් වූ හෝ ආපාචනයට ලක් වූවා යැයි සැකයට හේතු වූ යම් සතෙකුගේ මළකුණක් හෝ එහි කොටසක්, වෙන සතුන් විසින් වෙනත් ස්ථානයකට හෝ ප්‍රදේශයට හෝ රැගෙන යා හැකි වන පරිදි, යම් ස්ථානයක දැමීම හෝ ස්ථාන ගත කිරීම.

(2) එම පනතේ 6(1) වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර ව, ආසාදිත ප්‍රදේශය තුළ පිහිටි පාරවල් ඔස්සේ රෝග ආසාදිත සත්ව වර්ගයේ සතුන් ප්‍රවාහනය කිරීම මෙයින් තහනම් කරමි.

(3) එම පනතේ 6(1) හා 6(2) යන වගන්තිවල විධිවිධාන ක්‍රියාත්මක කිරීම කාර්ය සඳහා, උතුරු පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ වරයා විසින් එම කුර හා මුඛ රෝග ආසාදිත ප්‍රදේශය තුළ දී තීරණය කරනු ලබන ස්ථානවල බාධක යෙදවිය යුතු බව නියම කරමි.

(4) රෝග ආසාදිත ප්‍රදේශයට ආසන්නව, උතුරු පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ වරයා විසින් තීරණය කරනු ලබන අවරෝධක කලාපයේ සිටින්නා වූ අවධානයට ලක් වූ සැම සතෙකුටම, එම අවරෝදක කලාප භාර රජයේ පශු වෛද්‍ය නිලධාරියා විසින් නියම කරනු ලබන වේලාවේ දී හා ස්ථානයේ දී, කුර හා මුඛ රෝගයට එරෙහිව ප්‍රතිශක්තිකරණය කරවා ගැනීමට එම සතාගේ අයිතිකරු විසින් සිදු කළ යුතු බව, එම සත්ව රෝග පනතේ 7(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව නියම කරමි.

(5) එම සත්ව රෝග පනතේ 38 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බල තල ප්‍රකාර ව,

(අ) මෙම නියෝගයේ 2(1) වගන්තියෙන් තහනම් කරන ලද ක්‍රියා සිදුවීම් වැළැක්වීම හා, එවෙනි කටයුතු වල නියැලෙන අයට විරුද්ධව නීතිමය කටයුතු කිරීම යනු කාර්ය සඳහා එම පනතේ 3(3) වගන්තිය යටතේ බලයලත් නිලධාරී වශයෙන් කටයුතු කිරීම සඳහා ද, ඒ වෙනුවෙන් එම පනතේ 13 වැනි වගන්තියේ සඳහන් බලතල ක්‍රියාත්මක කිරීමටද, පහත සඳහන් නිලධාරීන්ට බලය පවරමි.

(i) අධ්‍යක්ෂ (සත්ව සෞඛ්‍ය) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.
(ii) නියෝජ්‍ය අධ්‍යක්ෂ (සත්ව සෞඛ්‍ය), සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.
(iii) පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ, උතුරු පළාත.
(iv) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ, වවුනියා දිස්ත්‍රික්කය.
(v) වව්නියා දිස්ත්‍රික්කයේ සියළුම කොට්ඨාස භාර රජයේ පශු වෛද්‍ය නිළධාරීන්.
(vi) ශ්‍රී ලංකා පොලිස් සේවයේ සියලුම පොලිස් නිළධාරීන්.

(ආ) එම පනතේ 6(3) වගන්තියේ කාර්ය සඳහා, බලයලත් නිලධාරී ලෙස කටයුතු කිරීමට, ශ්‍රී ලංකා පොලිසියේ සියලු ම පොලිස් නිලධාරීන්ට බලය පවරමි.

(ඇ) එම පනතේ 14 වැනි වගන්තියේ කාර්ය සඳහා ද, ඊට අදාළ ව එම පනතේ 13 වගන්තියේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ද, වව්නියා දිස්ත්‍රික්කයේ පශු විමර්ශන නිලධාරී, බලයලත් නිලධාරී බවට පත් කරමි.

(ඈ) රෝග ආසාදිත ප්‍රදේශවලට අදාළ ව, එම පනතේ 3(2), 5(4), 12(1) හා 12(2) යන වගන්තිවල, පශු වෛද්‍ය නිලධාරියෙකුට පැවරී ඇති බලතල හා රාජකාරි, තමන්ගේ බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා, එම ප්‍රදේශ භාර රජයේ පශු වෛද්‍ය නිලධාරීන්ට බලය පවරමි.

(ඉ) එම පනතේ 9 හා 11 වන වගන්තිවල කාර්ය සඳහා ද, ඊට අදාළ ව, 13 වන වගන්තියෙන් බලයලත් නිලධාරියෙකුට පවරා ඇති බලතල හා රාජකාරි ක්‍රියාත්මක කිරීම සඳහා ද, කුර හා මුඛ රෝග ආසාදිත ප්‍රදේශයේ සියළු රජයේ පශු වෛද්‍ය නිලධාරියන්, බලයලත් නිලධාරි ලෙස කටයුතු කළ යුතු බව මෙයින් නියෝග කරමි.

(වෛද්‍ය) ඩබ්ලිව්. කේ. ද සිල්වා,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

03 - 92/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.